31

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශාස්ත්‍රවේදී සිව්වන වසර ප්‍රථම අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2018 අගෝස්තු / සැප්තැම්බර්
ආර්ථික විද්‍යාව

# ECON 4130.03 – අන්තර්ජාතික ආර්ථික ප්‍රතිපත්ති

කාලය: පැය තුන (03) යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. සියලු ම ප්‍රශ්නවලට සමාන ලකුණු ලැබේ.

පැහැදිලි අත්අකුරු පිළිබඳ සැලකිලිමත්වන්න.

01. i). ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ අධ්‍යයනයන්හි පවතින ප්‍රධාන ක්ෂේත්‍ර මොනවාද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii). අ) "රටකට වඩාත් කාර්යක්ෂම වන්නේ නිදහස් වෙළෙඳාම යි" තර්කානුකූලව විවරණය කරන්න.

හෝ

ආ) "නිදහස් වෙළෙඳාමට වඩා ප්‍රතිපත්තිමය මැදිහත්වීම වඩා ඵලදායී වේ" තර්කානුකූලව විවරණය කරන්න.

(ලකුණු 06)

iii). ජාත්‍යන්තර වෙළෙඳාමට අදාළ සුභසාධන තර්කයෙන් අදහස් වන්නේ කුමක් ද? පැහැදිලි කරන්න.

(ලකුණු 06)

02. i). අන්තර්ජාතික වෙළෙඳාම පිළිබඳ වාණිජවාදයේ මූලික තර්කය කුමක් ද? පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii). "වාණිජවාදී වෙළෙඳ ප්‍රතිපත්ති නිදහස් වෙළෙඳාමට ප්‍රතිවිරුද්ධ වේ" මෙම ප්‍රකාශයෙහි වලංගුතාව විභාග කරන්න.

(ලකුණු 06)

iii). වාණිජවාදී වෙළෙඳ ප්‍රතිපත්තිවල වර්තමාන බලපෑම ඔබ හඳුනාගනු ලබන්නේ කෙසේද? පැහැදිලි කරන්න.

(ලකුණු 06)

03. i). පළමු වන ලෝක යුද්ධයට පෙර ජාත්‍යන්තර වෙළෙඳාම කෙරෙන් හඳුනාගතහැකි විශේෂ වෙළෙඳ ප්‍රතිපත්ති මොනවාද?

(ලකුණු 05)

ii). වෙළෙඳ ප්‍රතිපත්තියක් වශයෙන් ආරක්ෂණවාදයට බුද්ධිමය පිළිගැනීමක් ඇතිවූයේ කෙසේද? පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii). පළමු වන ලෝක යුද්ධයට පෙර යුරෝපා රටවල ආරක්ෂණවාදයට යොමු වීමට බලපෑ හේතු මොනවාද?

(ලකුණු 05)

06. i). ''අන්තර් යුද්ධ කාලීන නෝර්විපියානු වෙළෙඳ ප්‍රතිපත්තිය ආරක්ෂණය වෙත යොමුවීමක් දැකගත හැකි ය'' පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii). පළමු ලෝක යුද්ධයෙන් පසුව බ්‍රිතාන්‍යයේ වෙළෙඳාම පිරිහීම සඳහා බලපෑ ප්‍රතිපත්තිමය බලපෑම් මොනවාද?

(ලකුණු 05)

iii). බ්‍රිතාන්‍යයේ, තීරු බදු සඳහා 1932 සංශෝධනයෙහි හඳුනාගත හැකි විශේෂතා මොනවාද?

(ලකුණු 05)

07. i). තීරු බදු පිළිබඳ පොදු ගිවිසුමෙහි (GATT) ප්‍රධාන සම්මුතීන් මොනවාද?

(ලකුණු 05)

ii). ''තීරු බදු පිළිබඳ පොදු ගිවිසුමට අදාළ උරුගුවේ සාකච්ඡා වටය ජාත්‍යන්තර වෙළෙඳාමේ සාධනීය ප්‍රතිඵල සහිත අවස්ථාවක් විය'' තර්කානුකූලව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii). තීරු බදු පිළිබඳ පොදු ගිවිසුම මඟින් අවධානය යොමු නොකළ ක්ෂේත්‍ර මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

08. i). ලෝක වෙළෙඳ සංවිධානය (WTO) අනුගමනය කරන මූලධර්ම මොනවාද?

(ලකුණු 04)

ii). වර්තමානයේ දී ලෝක වෙළෙඳ සංවිධානය මුහුණ දී ඇති අභියෝග මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii). සංවර්ධනය වෙමින් පවතින රටවල් ජාත්‍යන්තර වෙළෙඳාමේ දී මුහුණ දෙන ගැටලු මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 06)

***********